# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1994/70 - 2016 නොවැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2016.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : BER 4/5/2/49.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 03/J/79/E/1106.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්පත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 768 - පාඩාගොඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේ ජනරාල්ගේ ක. 4618 දරන පිඹුරේ කැබලි අංක 01, 02 හා 04 ලෙස පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණය හෙක්ටයාර් 0.5214 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි තුන (03):

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: මාදන්ගහකුරුඳුවත්ත *නොහොත්* මාදන්ගහදිගන; විස්තරය: විවෘත මුඩුබිම, පාදාගොඩ මහ විදුහල් ක්‍රීඩා පිටිය සඳහා පරිහරණය කරයි, ප්‍රවේශ මාර්ගය සඳහා වෙන්කල බිම්; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0108.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: මාදන්ගහකුරුඳුවත්ත *නොහොත්* මාදන්ගහදිගන; විස්තරය: විවෘත මුඩුබිම, පාදාගොඩ මහ විදුහල් ක්‍රීඩා පිටිය සඳහා පරිහරණය කරයි; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.5054.

03. **කැබලි අංක 04**
ඉඩමේ නම: මාදන්ගහකුරුඳුවත්ත *නොහොත්* මාදන්ගහදිගන; විස්තරය: විවෘත මුඩුබිම, පාදාගොඩ මහ විදුහල් ක්‍රීඩා පිටිය සඳහා පරිහරණය කරයි, ප්‍රවේශ මාර්ගය සඳහා වෙන්කල බිම්; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0052.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017 ජනවාරි මස 04 වැනි දින පෙ. ව. 10.00 ට බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තව ද, 2016 දෙසැම්බර් මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

කේ. ජී. ඩී. චතුර මල්රාජ්,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2016 නොවැම්බර් මස 18 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 471

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : DER/LAN/LAQUI/A1/10.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/6/2013/HW/8.

මා විසින් 2016 සැප්තැම්බර් මස 05 වැනි දින අංක 983/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් රජයට අත්පත් කර ගැනීම පිළිබඳ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි පරීක්ෂණ දිනයන් පහත පරිදි සංශෝධනය කරන ලදී.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2016 දෙසැම්බර් මස 28 හා 29 වැනි දිනයන්හි පෙ. ව. 10.00 ට දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 දෙසැම්බර් මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි ද පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කල යුතු ය.

එස්. පී. ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
දැරණියගල.

2016 නොවැම්බර් මස 22 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 472

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.